අභ්‍යන්තර, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Internal & Home Affairs and Provincial Councils & Local Government
ස්වදේශ කටයුතු අංශය (පාලන) | உள்நாட்டலுவல்கள் பிரிவு (நிர்வாகம்) | Home Affairs Division (Administration)

මගේ අංකය / எனது இல / My No: HA/05/06/02/G(III)තාවකාලික
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.08.21

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

<u>සංචාරක බංගලා මාර්ගගතව (Online) වෙන් කිරීම සම්බන්ධව පුහුණු වැඩමුළුව</u>

අප අමාත්‍යාංශය යටතේ පාලනය වන සියළුම සංචාරක බංගලා මාර්ගගතව වෙන් කිරීම සඳහා ක්‍රමවේදයක් අමාත්‍යාංශය මඟින් සකස් කර ඇති අතර ඒ සම්බන්ධව පුහුණු වැඩමුළුවක් **"නිල මැදුර" ස්වදේශ කටයුතු අමාත්‍යාංශ පරිශ්‍රයේදී 2019.08.29 වන දින පෙ.ව. 09.00 ට** පැවැත්වීමට කටයුතු යොදා ඇත.

02. උක්ත පුහුණු වැඩමුළුව සඳහා ඔබ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පහත සඳහන් නිළධාරීන් සහභාගී කරවීමට කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

I. සංචාරක බංගලා වෙන් කිරීම් සම්බන්ධ විෂය භාර නිලධාරියා
II. එම නිලධාරියාගේ සමීපතම අධීක්ෂණ නිලධාරියා/ මාණ්ඩලික නිලධාරියා
III. සංචාරක බංගලා සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදන සම්බන්ධව විෂය භාරව කටයුතු කරන නිලධාරියා

03. තවද, මේ සඳහා සහභාගී වීමේදී පහත සඳහන් ලේඛනද, රැගෙන ආ යුතු බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

I. 2019 වර්ෂය සඳහා පහත කරුණු සම්බන්ධව මෙතෙක් ලබා දී ඇති ප්‍රතිපාදන වල ප්‍රගතිය සඳහන් වාර්තාව
   - ප්‍රධාන අළුත්වැඩියා සම්බන්ධව ලබා දුන් ප්‍රතිපාදන
   - සුළු අළුත්වැඩියා සම්බන්ධව ලබා දුන් ප්‍රතිපාදන
   - උපකරණ මිලදී ගැනීමට අදාලව ලබා දුන් ප්‍රතිපාදන

II. සංචාරක බංගලාව සතු භාණ්ඩ ලේඛනයෙහි පිටපතක් (Copy of Inventory List)

04. මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ.ජී.ධර්මතිලක
අතිරේක ලේකම් (පාලන)
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

පිටපත:- සහකාර අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ - කරු.අ.ක.ස.